# <u>වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් සිය පළමු වාර්ෂික සම්මේලනය පවත්වයි</u>

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය වන රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය විසින් පසුගියදා පළමුවරට සංවිධානය කරන ලද වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ හා සංගමයේ ආශ්‍රිත සාමාජික සාමාජිකාවන්ගේ වාර්ෂික සම්මේලනයේදි රාජ්‍ය අංශයේ විශ්වාසනියත්වය හා වගකිවයුතු බව ඉහල නැංවීමට තිරසාර රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පිළිබඳව ඉදිරියට සිතා බැලීම අවධාරණයට ලක් විය.

විෂය පිළිබඳව ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම සම්මේලනයේදි විවිධ කරුණු පිළිබඳව මතයන් හා සිතාබැලීම් සාකච්ඡාවට භාජනය විය. මෙහි ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ජාතික ආර්ථික සභාවේ උප ප්‍රධානි සි. ජේ. පි. සිරිවර්ධන මහතා විසිනි. රටේ ආර්ථික තත්ත්වය ගොඩගැනීමට නිසි මූල්‍ය කළමනාකරණයක අවශ්‍යතාවය ඔහු විසින් අවධාරණය කරන ලදි.

රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සභාපති වී. කනගසභාපති මහතා වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් හා සෙසු සාමාජික සාමාජිකාවන් එකතුව මෙවැනි වාර්ෂික සම්මේලනයක් පැවැත්වීම මගින් ඵලදායි අඛණ්ඩ වෘත්තිය අධ්‍යාපනයක් ලබාගත හැකිවන බවත් ජාතික පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට එය ඉවහල් වන බවත් පැවසිය.

විගණකාධිපති ගාමිනි විජේසිංහ මහතා ජාතික විගණන පනත මගින් වගකිවයුතු බව ඉහල නැංවීමට කරුණු සලසා ඇති බවට කරුණු දැක්වූ අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා විශාකා අමරසේකර මිය විසින් අය-වැය හිගයේ උපනතිය හා රාජ්‍ය මූල්‍යකරණයේදි මුහුණ දි ඇති ගැටලු ඉදිරිපත් කරන ලදි. බදු ප්‍රතිසංවිධානය තිරසාර සංවර්ධනය අරමුනු කරගෙන සිදුවිය යුතු බවට කරුණු දැක්වූ දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධර්මදාස රන්ගල්ල මහතා වර්තමාන බදු පනතේ බලපෑම පිළිබඳව විග්‍රහයක යෙදුනි.

යටත් විජිතවාදයෙන් අපට උරුමවූ අය-වැය ක්‍රියාවලියේ එදා සහ අද තත්ත්වය විශ්ලේෂණය කල කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කතිකාචාර්ය ඒ.ඒ.සි. අබේසිංහ මහතා ශ්‍රී ලංකාවේ අය-වැය නිසි මාර්ගයක් ගන්නේද? යන්න ප්‍රකාශ කර සිටියේය.

රාජ්‍ය අංශයේ නිසි මූල්‍ය කළමනාකරණයට උපචිත පදනම් ගිණුම්කරනයක අවශ්‍යතාවය පිළිබඳව කරුණු දැක්වූ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධ්‍යපන හා පුහුණු අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය එන්. නාගේන්ද්‍රකුමාර් මහතාගේ දේශනයේදි ඒ සඳහා ආයතනික වශයෙන් නැවත සිතාබැලීම්වල අවශ්‍යතාවය හා රාජ්‍ය අංශයේ සුදානමේ අඩුපාඩු විමසිමට ලක් විය.

සම්මේලනය අවසානයේදි ඉහත ප්‍රවිනයන්ට අමතරව රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සභාපති වී. කනගසභාපති මහතාගේ හා අධ්‍යයන කමිටුවේ සභාපති ග්‍රෙගරි ප්‍රනාන්දු මහතාගේද සහභාගිත්වයෙන් පැවති සාකච්ඡා සභාව මෙහෙයවන ලද්දේ වරලත් ගණකාධිකාරී ආයතනයේ උප සභාපති මානිල් ජයසිංහ මහතා විසිනි. වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී වරුන්ද මෙහිදි කරුණු දක්වන ලදි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ජගත් පෙරේරා මහතාද රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සභාපති වී. කනගසභාපති මහතාද සම්මේලනය ඇමතු අතර එහි සමාප්ති දේශනය පවත්වන ලද්දේ ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි අචාර්ය තාරක ලියනපතිරන මහතා විසිනි. සංගමයේ ලේකම් ආනන්ද අමරවංශ මහතා ස්තුති කතාව කරන ලදි.